# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## ශාසන ඉතිහාසය

### 02 වන පාඩම; ධර්ම සංගායනා

[[ 2024/2025 ]] **04 වන ප්‍රශ්නය**

I ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳව ප්‍රමාණවත් සටහනක් සම්පාදනය කරන්න.
II දෙවන ධර්ම සංගායනාව පැවත්වීම සඳහා බලපෑ හේතු ලියා දක්වන්න.
III බුදු සසුනේ ව්‍යාප්තිය උදෙසා ප්‍රථම හා දෙවන ධර්ම සංගායනා ඉවහල්වූ අයුරු පෙන්වා දෙන්න.

[[ 2020/2021/2022/2023 ]] **04 වන ප්‍රශ්නය**

I බෞද්ධ ධර්ම සංගායනා කුමන අරමුණු ඇතිව ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙළක්දැයි පැහැදිලි කරන්න.
II තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් කරන්න.
III හේතුව,කාලය,මූලිකත්වය,සහාභාගීත්වය සහ ස්ථානය ආදී කරුණු ඇතුළත් වන සේ දෙවන ධර්ම සංගායනාව පිළිබඳ සටහනක් පිළියෙළ කරන්න.

[[ 2019/2020 ]] **04 වන ප්‍රශ්නය**

I පළමු,දෙවන,තෙවන ධර්ම සංගායනාවලට අනුග්‍රාහය දැක්වූ රජවරුන් අනුපිළිවෙළින් නම් කරන්න.
II පළමු ධර්ම සංගායනාව පැවත්වීමට බලපෑ හේතුව පැහැදිලි කරන්න.
III ධර්ම සංගායනාවක් පැවත්වීමේ වැදගත්කම බුදුන් වහන්සේ හා බුද්ධ කාලීන ශ්‍රාවකයන් දැන සිටි බවට වන සාධක ගෙනහැර දක්වන්න.

[[ 2018/2019 ]] **03 වන ප්‍රශ්නය**

I දෙවන ධර්ම සංගායනාව පැවත්වීමට මුල්වූ හේතු කවරේදැයි පෙන්වා දෙන්න.
II දෙවන ධර්ම සංගායනාවෙහි ප්‍රතිඵල සාකච්ඡා කරන්න.
III “ ප්‍රථම ධර්ම සංගායනාවේ අරමුණ වූයේ විසිර පැවති ධර්මය ඒකරාශී කොට වෙනස්කම්වලට භාජනය වීමට ඉඩ නොදී සුරැකිව තැබීමයි.” මෙම ප්‍රකාශය තහවුරු කරන්න.

[[ 2016/2017 ]] **03 වන ප්‍රශ්නය**

I නිගණ්ඨනාථපුත්තගේ අභාවයෙන් නිගණ්ඨ පිරිස දෙකඩ වූ පසු අනඳ හිමියන් චුන්ද තෙරුන් සමග ගොස් ඒ බව දැන්වූ විට බුදුන් වහන්සේ දුන් උපදෙස් සඳහන් කරන්න.
II එම අවස්ථාව පිළිබඳ සැරියුත් හිමියන් කළ ප්‍රකාශය ලියා දක්වන්න.
III ප්‍රථම ධර්ම සංගායනාවට හේතු, සංගීතිකාරක තෙරවරු,ස්ථානය,අනුග්‍රාහකත්වය

,ප්‍රතිඵල ප්‍රකට වනසේ සංගායනාව විස්තර කරන්න.

## 05 වන ප්‍රශ්නය

I -

II තුන්වෙනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල විස්තර කරන්න.

III 'තුන්වෙනි ධර්ම සංගායනාව පැවත්වූ බව ඓතිහාසික සත්‍යයකි.' යන ප්‍රකාශයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

## [[ 2015/2016 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ ධර්මය පිළිබඳ සංගායනා කිහිපයක් භාරත දේශයේද,ලංකාවේද සිදුවූ බව වාර්ථා වෙයි.එම සංගායනා කවරේදැයි නම් කරන්න.

II පළමු සංගායනාවට සහභාගීවූ බුදුන් වහන්සේගේ සම්මුඛ ශ්‍රාවකයන්ද එහි දී මූලික කාර්‍ය භාරය ඉටු කළ තෙරවරුන්ද නම් කර තෙරවරුන් විසින් ඉටු කරන ලද කාර්‍ය භාරය විස්තර කරන්න.

III පළමු සංගායනාව අවසන් වීමෙන් පසු භික්ෂූන් වහන්සේලා විසින් අනඳ හිමියන්ට ඉදිරිපත් කළ චෝදනා පහ දක්වා,ඒ සම්බන්ධයෙන් උන් වහන්සේ ක්‍රියා කළ ආකාරය පැහැදිලි කර,බුද්ධ ශාසනයේ පැවත්මට පළමු සංගායනාව නිසා මූලික පදනම වැටුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

## 04 වන ප්‍රශ්නය

I දස වස්තුව විනිශ්චය කිරීමට පත් කරන ලද කාරක සභාවේ වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පත්වූ හතර නමත්,පාවෙය්‍යක භික්ෂූන් වෙනුවෙන් පත්වූ හතර නමත් නම් කරන්න.

II භද්‍ර හෙවත් මහාදේව තෙරණුවන්ගේ පංච වස්තුව නම් කරන්න.

III සංඝ සමාජය නිකාය වශයෙන් බෙදී ගිය ආකාරය දක්වා,නිකාය භේදය නිසා ඇතිවූ ප්‍රතිඵල අගය කරන්න.

## [[ 2014/2015 ]] 03 වන ප්‍රශ්නය

I ධර්ම සංගායනා පැවත්වීමේ වැදගත්කම බුදුන් වහන්සේ විසින් ඉදිරිපත් කළ බවත්, සැරියුත් හිමියන් විසින් සංගායනාවක මූලික කටයුතු සිදුකර ඇති බවත්, සූත්‍ර දේශනා ඇසුරින් ප්‍රකට වේ. එම සූත්‍ර තුනක නම් සඳහන් කරන්න.

II ප්‍රථම ධර්ම සංගායනාව පැවත්වීමට තුඩුදුන් ආසන්න හේතුව හා ඊට පසුබිම් වූ තවත් ශාසනික සිදුවීම් කිහිපයක් දක්වන්න.

III ප්‍රථම සංගායනාවට මූලික වූ තෙරවරුන් ,සහභාගීවූ සංඛ්‍යාව, ස්ථානය,රාජානුග්‍රාහය,සංගායනාවට විෂය වූ කරුණු හා එහි ප්‍රතිඵල යන කරුණු විස්තර වනසේ හැඳින්වීමක් කොට,එයින් බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සැළසුණු ආකාරය පැහැදිලි කරන්න.

## 04 වන ප්‍රශ්නය

I ථේරවාද වාර්ථාවලට අනුව වජ්ජි රටෙහි භික්ෂූන් වහන්සේලා විසින් කැප යැයි සම්මත කරගත් කරුණු දහය දක්වන්න.

II අකැප දස වස්තුවෙහි ඇතුළත් වන්නේ දිවි පැවත්ම පිළිබඳ කරුණු මිස බෞද්ධ දර්ශනය පිළිබඳ කරුණු නොවේ.යන කියමන පැහැදිලි කරන්න.

III දස වස්තුව පිළිබඳ ගැටලුව නිරාකරණය කොට දෙවෙනි ධර්ම සංගායනාව පැවත්වූ ආකාරයත්,එහි ප්‍රතිඵලයත් පැහැදිලි කරන්න.

## [[ 2013/2014 ]] 03 වන ප්‍රශ්නය

I පළමු ධර්ම සංගායනාව සඳහා බලපෑ ඓතිහාසික හා සාමාජික හේතු පෙන්වා දෙන්න.

II පළමු ධර්ම සංගායනාවේදී භික්ෂූන් විසින් ආනන්ද තෙරුන්ට ඉදිරිපත් කළ චෝදනා තුනක් නම් කරන්න.

III පළමු සංගායනාවේ ප්‍රතිඵල පෙන්වා දෙන්න.

## [[ 2012/2013 ]] 03 වන ප්‍රශ්නය

I දෙවන ධර්ම සංගායනාව පැවත්වීමට බලපෑ හේතුව,ගතවූ කාලය,සහභාගීවූ මහරහතන් වහන්සේලා ප්‍රමාණය,ස්ථානය,අනුග්‍රාහය දැක්වූ රජතුමා,ප්‍රධානත්වය ගත් රහතන් වහන්සේ නම් කරන්න.

II සර්වාස්තිවාදීන් ඉදිරිපත් කළ දස වස්තුවෙන් තුනක් ලියා දක්වන්න.

III දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල පෙන්වා දෙන්න.

## [[ 2011/2012 ]] 03 වන ප්‍රශ්නය

I "ප්‍රථම ධර්ම සංගායනාවට ආසන්නම හේතුව එක් භික්ෂුවකගේ වගකීමෙන් තොර ප්‍රකාශයකි." එම භික්ෂුව නම් කොට,ප්‍රකාශයද සඳහන් කරන්න.

II මූලික කරුණු සමඟින් ප්‍රථම සංගායනාව පැවත්වූ ආකාරය පැහැදිලි කරන්න.

III " ධර්මයෙහි පවිත්‍රතාවයට සහ බුදුසසුනේ චිරස්ථිතියට එම සංගායනාව ප්‍රබල පිටුවහලක් විය." පැහැදිලි කරන්න.

## [[ 2010/2011 ]] 03 වන ප්‍රශ්නය

I දෙවන ධර්ම සංගායනාව පැවත්වීමට හේතුව,පැවත්වූ කාලය,මූලිකත්වය,ප්‍රධාන දායකත්වය,සහභාගීවූ ප්‍රමාණය,ස්ථානය ලියා දක්වන්න.

II සර්වස්තිවාදීන් ඉදිරිපත් කළ දසවස්තුවෙන් තුනක් නම් කරන්න.

III දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල පෙන්වා දෙන්න.

## [[ 2009/2010 ]] 04 වන ප්‍රශ්නය

I "ප්‍රථම ධර්ම සංගීතිය කැඳවීමේ ආසන්නම හේතුව සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශයකි.එහෙත් ඒ කායී සඳහා බලපෑ වෙනත් ඓතිහාසික සහ සාමාජීය හේතුද තිබුණි." නිදසුන් දෙකක් දක්වමින් මේ කියමන සනාථ කරන්න.

II ථේරවාද බුදු දහමේ චිරස්ථිතිය සඳහා ප්‍රථම සංගායනාවේ ප්‍රතිඵල වලින් ලැබුණු බලපෑම පෙන්වා දෙන්න.

## [[ 2008/2009 ]] 03 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ සිටම සංඝ සමාජය තුළ ධර්ම විනය පිළිබඳ විවිධ මත දැරූ අය සිටි බවට කරුණු ඉදිරිපත් කරන්න.

II කාලාශෝක රාජ්‍ය සමය වන විට රහතන් වහන්සේ පිළිබඳ විවිධ විචාර ගොඩ නැගෙමින් පැවතුණි. නිදසුන් අවශ්ථා ඇසුරෙන් විමසීමක් කරන්න.

## [[ 2006/2007 ]] 03 වන ප්‍රශ්නය

I වජ්ජිපුත්‍රක භික්ෂූන් වහන්සේලා විසින් ඉදිරිපත් කරන ලද දස වස්තුව කෙටියෙන් හඳුන්වා දෙන්න.

II "දස වස්තු සංකල්පය සමකාලීන භික්ෂු සමාජයේ මූලික අවශ්‍යථා පදනම් කොට ගොඩ නැඟුණකි."විමසන්න.

III "භාරතීය ශාසන ඉතිහාසයේ නිකාය භේදයට හේතුව වජ්ජි භික්ෂූන්ගේ දස වස්තුව නොව,මහාදේව තෙරුන් ඉදිරිපත් කරන ලද පංච වස්තුවයි." විමසීමට ලක් කරන්න.

## [[[ 2005 ]]] 02 වන ප්‍රශ්නය

I "දෙවන ධර්ම සංගායනාවෙන් පසුව ඇතිවූ නිකාය භේදය ද? භික්ෂු ශාසනයට රාජ්‍ය අනුග්‍රහය ලැබීමත් සමග ලාභ සත් කායීයෙහි ගිජුවූ තීර්ථකයන්ගේ සසුන්ගත වීම ද තුන් වන ධර්ම සංගායනාවට හේතු විය."යන්න විමසීමට ලක් කරන්න.

II ප්‍රධානත්වය,රාජ්‍ය අනුග්‍රාහය,ස්ථානය ආදී තොරතුරු අන්තර්ගත වන සේ තුන්වන ධර්ම සංගායනාව පැවත්වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.

III තුන්වන ධර්ම සංගායනාව පැවත්වීමට හේතු පාදකවූ අරමුණු ඵලදායී ලෙස ඉටුවී දැයි තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ආශ්‍රයෙන් විමසීමක් කරන්න.

## [[[ 2004 ]]] 04 වන ප්‍රශ්නය

I –

II අනද හිමියන්ට ඉදිරිපත් කළ චෝදනා පහ හා උන්වහන්සේ එම චෝදනාවලට දුන් පිළිතුරු කෙටියෙන් දක්වන්න.

III දස වස්තුව නම් කොට,එම දස වස්තුව විනය නොවේ යැයි විනිශ්චය කිරීම පිළිබඳ කථා පුවත විස්තර කරන්න.

## [[[ 2002 ]]] 03 වන ප්‍රශ්නය

I බෞද්ධ ධර්ම සංගායනාවන් කුමන අරමුණු ඇතිව ක්‍රියාත්මක කරන ලද වැඩ පිළිවෙළවල් දැයි පැහැදිලි කරන්න.

II "දෙවන ධර්ම සංගීතියට හේතු වූ අකැප වස්තුව යනු භික්ෂූන් වහන්සේලාගේ සමකාලීන ජීවන අවශ්‍යතා පදනම් කරගත් කරුණු දහයකි." මේ අදහස විමසීමට ලක් කරන්න.

III ධර්මාශෝක රජු දවස සිදුවූ තුන්වන ධර්ම සංගීතියේ ප්‍රතිඵල පිළිබඳව සමාලෝචනයක් කරන්න.

[[[ 2001 ]]] 03 වන ප්‍රශ්නය

I ධර්ම සංගායනා කිරීමේ අවශ්‍යතාව බුද්ධ කාලයේදීම පැන නැඟුණු බවට දැක්විය හැකි සාක්ෂි ඉදිරිපත් කරන්න.

II වර්ෂය,ස්ථානය,සහභාගී වූ පිරිස හා ප්‍රතිඵල යන කරුණු ඇතුලත් වනසේ තුන්වන ධර්ම සංගීතිය පිළිබඳව සටහනක් ලියන්න.

III ශාසන ඉතිහාසය හැදෑරීමේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳව විමසීමක් කරන්න.

[[[ 2000 ]]] 03 වන ප්‍රශ්නය

I ධර්ම සංගායනා සංකල්පය බුදුරදුන් වැඩ සිටි අවදියේම ආරම්භ වූවක් හැටියට පෙන්වා දීමට ඉදිරිපත් කළ හැකි සාධක කවරේදැයි විමසන්න.

II හේතුව,වර්ෂය,ස්ථානය,දායකත්වය,සහභාගීවූ පිරිස,ප්‍රතිඵල යන කරුණු ඇතුළත් වනසේ දෙවන ධර්ම සංගායනාව පිළිබඳ සටහනක් ලියන්න.

[[[ 1999 ]]] 03 වන ප්‍රශ්නය

I පලමු සංගායනාවට ආසන්න හේතුව හැටියට සැළකෙන සිද්ධිය සඳහන් කරන්න.

II පළමු සංගායනා වර්ෂය,ස්ථානය,දායකත්වය,සහභාගීවූ ගණන හා ප්‍රතිඵල ඇතුළත් වනසේ කෙටි සටහන් ලියන්න.

III තුන්වන ධර්ම සංගායන්නවෙන් ඇතිවූ ප්‍රතිඵල කෙබඳු වීද?

[[[ 1998 ]]] 02 වන ප්‍රශ්නය

I මුල් සංගායනා තුන පිළිබඳ වර්ෂය ස්ථානය,දායකත්වය,සහභාගීවූ ගණන,නිමිත්ත යන කරුණු ඇතුළු සටහනක් සපයන්න.

II ථේරවාද ග්‍රන්ථවල සඳහන් අයුරින් දෙවන සංගායනාවට හේතුවූ දස අකැප වස්තුව නම් කරන්න.

[[[ 1997 ]]] 03 වන ප්‍රශ්නය

ප්‍රථම ධර්ම සංගායනාව පැවත්වීමට හේතුවූ ආසන්න කරුණුද,ඒ සඳහා හේතු වන්නට ඇතැයි සිතිය හැකි වෙනත් කරුණු ගැනද විමසීමක් කරන්න.

[[[ 1996 ]]]

03 වන ප්‍රශ්නය

දෙවන ධර්ම සංගායනාව පිළිබඳව විස්තරයක් සපයන්න.

විල්වල ස්වෝලේ හාමුදුරුවෝ